8th International Conference of Multidisciplinary Approaches (iCMA), 2021
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka.
ISSN: 2386 – 1509
Copyright © iCMA


# විශ්වවිද්‍යාල සිසුන් අර්ධකාලීන රැකියාවලට යොමු වීම හරහා සිසුන්ගේ ශ්‍රේණි ලකුණු සාමාන්‍ය අගයට සිදු වන බලපෑම

ප්‍රියදර්ශනී අයි.ටී.එන්.*, කරුණාරත්න ජී.ඩී.පී., සහ කරුණාරත්න එම්.එම්.එස්.ඒ

ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
tharikanp@gmail.com

**සාරසංක්ෂේපය**

විශ්වවිද්‍යාල සිසුන් අර්ධ කාලීන රැකියාවලට යොමු වීමට බලපාන සාධක හා ඒ හරහා ඔවුන්ගේ අධ්‍යාපනයට සිදු වන බලපෑම මෙම අධ්‍යයනය තුළින් විමසා බලන ලදි. ඒ සඳහා 2019 වර්ෂයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ සිසුන් 200කින් යුතු නියැදියක් සරල සසම්භාවී නියැදීම යටතේ අධ්‍යයනයට භාජනය කරන ලදි. ප්‍රශ්නාවලියක් ආශ්‍රයෙන් අධ්‍යයනයට අදාළ ප්‍රාථමික දත්ත එක් රැස් කිරීම සිදු කළ අතර විශ්වවිද්‍යාල සිසුන් අර්ධකාලීන රැකියාවලට යොමු වීමට බලපාන සාධක හඳුනාගැනීම සඳහා ද්විමය ප්‍රවර්ධන ප්‍රතිපායන (Binary Logistic Regression) ආකෘතියක් භාවිත කරන ලදි. එසේ ම අර්ධකාලීන රැකියාවක් කිරීම නිසා ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනයට බලපෑමක් සිදු වේ ද යන්න අධ්‍යයනය කිරීම සඳහා බහු ගුණ ප්‍රතිපායන ආකෘතියක් යොදා ගන්නා ලදි. එහි දී පරායත්ත විචල්‍ය ලෙස ශ්‍රේණි ලකුණු සාමාන්‍ය අගයත් (GPA), ස්වායත්ත විචල්‍යයන් ලෙස අර්ධකාලීන රැකියාවලට යොමු වීම, සිසුන්ගේ වයසල සිසුන් විශ්වවිද්‍යාලයට පැමිණෙන්නේ කිනම් ස්ථානයක සිට ද?, සිසුන් හදාරන උපාධි පාඨමාලාව, අධ්‍යයන පරීක්ෂණ සඳහා සිසුන් තුළ පවතින පෙර සූදානම, දේශනවලට සහභාගී වීම ඇතුළු සාහිත්‍ය විමර්ශනයෙන් හඳුනාගත් විචල්‍යයන් කිහිපයක් භාවිතා කරන ලදි. පර්යේෂණයේ ප්‍රතිඵලවලට අනුව පෙනී යන්නේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ විශ්වවිද්‍යාල සිසුන් අර්ධකාලීන රැකියා සඳහා යොමු වීමට පුමිතිරි බව, පවුලේ මාසික ආදායම, මවගේ අධ්‍යාපන මට්ටම යන සාධක බලපාන බව යි. ඒ තුළින් ඔවුන් දේශන පවතින අතරතුර අර්ධකාලීන රැකියාවලට යොමු වීම හරහා ඔවුන්ගේ ශ්‍රේණි ලකුණු සාමාන්‍ය අගය කෙරෙහි ඍණ බලපෑමක් සිදු කරන බවත් මේ පර්යේෂණය හරහා ගම්‍ය විය.

**ප්‍රමුඛ පදඃ** *අර්ධකාලීන රැකියා, ශ්‍රේණි ලකුණු සාමාන්‍ය, විශ්වවිද්‍යාල සිසුන්*